ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2019
--------------------------------------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විභේදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත රුපියල් මිලියන 100 ක පොලී රහිත අත්තිකාරම් මුදලක් 2014 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද 2014 අංක 04 දරණ චක්‍රලේඛ යෝජනාවට අනුව ලබා දී ඇත. මෙම මුදල 2015 අගෝස්තු 31 දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් මුදල් මගින් හෝ ලාභාංශ පියවීමක් මගින් ආපසු ගෙවිය යුතුය. ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සමාගම සංස්ථාගත කිරීමේ දී, එක් පුද්ගලයකුට එක් සාමාන්‍ය කොටස බැගින් වන පරිදි සහ භාණ්ඩාගාර ලේකම් වෙත එම කොටස් දෙක ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැවරීමේ අවබෝධය මත එවකට සමාගමේ සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද, මෙම අත්තිකාරම් මුදල මේ දක්වා ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් ආපසු ගෙවා නොමැති අතර මෙම අත්තිකාරම් මුදල පියවීම සම්බන්ධයෙන් සමාගම ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් | අදහස් දක්වා නොමැත. | අත්තිකාරම් අයකර ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |

හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සමාගම සමග ගිවිසුමකට එළඹී නොමැත. තව ද, සමාගම් රෙජිස්ට්‍රාර් වරයාගේ වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්හි මුළු කොටස් ප්‍රමාණය තවමත් මහා භාණ්ඩාගාරයට පවරා නොතිබූ අතර එය පුද්ගලයින් දෙදෙනෙකුට අයත් වේ. එබැවින් එම අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමේ හැකියාව සහ සමාගමට අයත් එවැනි වත්කමක පැවත්ම සම්බන්ධයෙන් විවේචනාත්මක සැකයක් විගණනය සතුව පවතී.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති පිළිබඳ සඳහන් රෙගුලාසි ආදිය | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) මාර්ගෝපදේශ අංක 5.2.1 | ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් අයවැයට ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, එවැනි ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් 2019 වර්ෂය සඳහා සකස් කර නොමැත. | 2019 ජනවාරි 17 දින විගණනයට භාර දුන් අයවැයට ප්‍රාග්ධන වියදම් අයවැය ඇතුළත් විය. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (ii) මාර්ගෝපදේශ අංක 9.2 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරය යටතේ අනුමත කාර්ය මණ්ඩලයක් සහිතව ලියාපදිංචි කර ඇති ඇති සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොපවතී. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සමාගමේ වාර්ෂික අයවැයට සියලු නව කාර්ය මණ්ඩල වියදම්/ අයවැය ප්‍රතිපාදන ඇතුළත් කර ඇති බැවින් කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබා ගැනීමේ පිළිවෙතක් මානව සම්පත් සම්බන්ධයෙන් නොමැත. කෙසේ වෙතත්, සමාගම් ව්‍යුහයේ පිටපතක් සමාගම විසින් **2019** ජනවාරි **17** දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. සමාගමේ ව්‍යුහය සහ වෙනත් අදාළ ලේඛන **2019** සැප්තැම්බර් **19** දින කළමනාකරණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත. | |
| **(iii)** | මාර්ගෝපදේශ අංක **9.3** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සමාගම සතුව නොමැත. | සියළුම කාර්ය මණ්ඩල උසස්වීම් කාර්ය සාධන කළමනාකරණ යෝජනා ක්‍රමය මත පදනම්ව රේඛීය අධීක්ෂකවරුන් / ක්‍රියාකාරී ප්‍රධානීන් විසින් නිර්දේශ කර ඇති අතර කළමනාකරණ අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iv)** මාර්ගෝපදේශ අංක **9.7** | වැටුප් හා දීමනා අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම මාර්ගෝපදේශයේ සඳහන් අවශ්‍යතාවයට අනුකූල වී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විධායක වැටුප් ලේඛනයේ දළ වැටුප මසකට රුපියල් **51,000** සිට රුපියල් **641,000** දක්වා පරාසයක ව්‍යාප්ත වී ඇත. | සියලුම කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා යෝජනා ක්‍රම සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබේ. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. මීට අමතරව, වාර්ෂික මහසභා රැස්වීමේදී වාර්ෂික ගිණුම් අනුමත කරනු ලැබේ. සමාගම විසින් ව්‍යුහාත්මක සේවකයින් සහ වැටුප් ව්‍යුහය පිළිබඳ සියලු විස්තර සහිත ලිපියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට **2019** සැප්තැම්බර් **19** දින යවා ඇති නමුත් ඊට ප්‍රතිචාර ලැබී නොමැත. මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපත් කරන ලද **2020** මැයි **20** දිනැති ලිපිය මගින්, සමාගම වර්තමානයේ අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳව විගණනයට දැනුම් දී ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (ආ) **2015** ජුනි **17** දිනැති අංක පීඊඩී **3/2015** දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| **i)** මාර්ගෝපදේශ අංක **2.2** | සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා තීරණය කිරීමට පෙර සමාගම විසින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ඇතුළුව සමාගමේ අන්තර් සේවකයින්ගේ වැටුප් හා දීමනා තීරණය කිරීමට | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ලැබී නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩලයට අවස්ථාව ලබා දී ඇත. | |
| **ii)** | මාර්ගෝපදේශ අංක **2.9** | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සමාගම විසින් සභාපතිවරයාට ගෙවන ලද දීමනා මත සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ගෙවා ඇත. | ඔහු විධායක සභාපතිවරයෙක් සහ ස්ථිර සේවක මණ්ඩලයට ඇතුලත් වන බැවින් මෙය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී ද අනුමත කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **1,445,487,731** ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. **1,538,654,595**ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **93,166,864**ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**2.2** **අනුපාත විශ්ලේෂණය**

විගණනයට ලද තොරතුරුවලට අනුව **2019** වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත පහත පරිදි වේ.

| | **2019** | **2018** |
|---|---|---|
| ලාභදායිතා අනුපාත (ප්‍රතිශත) | | |
| දළ ලාභ අනුපාතය | **84.68** | **83.98** |
| ශුද්ධ ලාභ අනුපාතය | **70.02** | **75.53** |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | **11.87** | **13.38** |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | **14.81** | **15.82** |
| ද්‍රවශීලතා අනුපාත (වාර ගණන) | | |
| ජංගම වත්කම් අනුපාතය | **14.34** | **5.10** |
| ක්ෂණික වත්කම් අනුපාතය | **14.32** | **5.09** |

සමාගමේ දළ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට **0.70** කින් ඉහල ගොස් ඇති අතර ශුද්ධ ලාභ අනුපාතය සියයට **5.51** කින් අඩු වී ඇත. තවද, පෙර වර්ෂයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට **1.51** කින් සහ සියයට **1.01** කින් අඩු වී ඇත. ඉකුත් වර්ෂයේ, දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ අලාභ මෙම අඩුවීම සඳහා බලපා ඇත. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය **9.24** කින් සහ **9.23** කින් වැඩි වී ඇත. පසුගිය වසර අවසානයේ පැවති ගෙවිය යුතු ලාභාංශ පියවීම හේතුවෙන් ජංගම වගකීම් සියයට **65** කින් අඩු වී තිබේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ගිවිසුම් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාගමේ ගබඩා ටැංකි, නල මාර්ග සහ පොම්පාගාර භාවිතා කිරීම සඳහා ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සමාගමෙන් ප්‍රතිදාන ගාස්තුවක් ලෙස තොග අංශය සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 51 ක් සහ ගෘහස්ත අංශය සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 31 ක් අය කර තිබුණි. කෙසේ වුවද, විගණනයේදී ප්‍රතිදාන ගාස්තු අනුපාතය නියම කිරීමේ පදනම පැහැදිලි නොවුණි. තවද, ව්‍යාපාරයේ නියමයන් හා කොන්දේසි නියම කිරීම සඳහා සමාගම සිය එකම පාරිභෝගිකයා වන ලිට්රෝ ගෑස් ලංකා සමාගම සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. | ලිට්රෝ ගෑස් ලංකා සමාගම (පෙර ෂෙල් සමාගම) සමඟ මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 51 බැගින් ප්‍රතිදාන ගාස්තු සඳහා ගිවිසුම අත්සන් කර ඇති අතර පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් එම අගය මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 31 දක්වා අඩු කර ඇත. | සමාගම ලිට්රෝ ගෑස් ලංකා සමාගම සමඟ පවතින ගිවිසුම යාවත්කාලීන කළ යුතුය. |